## රත්නපුර ප්‍රාදේශීය සභාව 2022.10.07 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2022.10.07. වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී පැවැත්විණි.

මෙදින රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය:-

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03 | එන්.විජය ශ්‍රී ශාන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 04. | ටී.ප්‍රේමතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 05. | රණවක කළුආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 06. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 07. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 08. | අයි.ඩබ්ලිව් අකිල රෝෂන් ලක්මාල් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 09. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 10. | පී.වී.අයි.එල්.විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 11. | යූ.කේ නන්දාවතී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 12. | ඒ.එම්.නිලන්ති අමරකෝන් මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 13. | කේ.ජී.එන්.අමරසිංහ මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 14 | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 15 | ගෝපාල් තම්බිරාජා මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 16. | කේ.ඒ.ජයරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 17. | වජිරා නන්දනී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 18. | උදය කුමාර් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 19. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 20. | රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ලලිත් බෝතුංගආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | ආර්.බී.නාලක සුදත්සිරි හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | ඕ.කේ. සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | ඩී.නිලන්ති දිපිකා යසරත්න මෙනවිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | ආර්.ඒ.පද්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

| | | |
|---|---|---|
| 01. | අනූෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | පී.වී.ඉසුරු ජයලත් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | ඊ.කේ.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගීවූනිලධාරීන් :-**

01.එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.09.14 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

නැත

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. නඩු අංක 23145/ඉඩම් (අස්/අංක:-240/2022) නඩුවේ විධිමත් තීන්දු ප්‍රකාරව ප්‍රාදේශිය සභාව ඇතුළු තවත් විත්තිකරුවන් 4 දෙනෙකු සඳහා ගෙවන ලෙස දන්වා ඇති නඩු ගාස්තු හා වන්දි මුදල වන රු:-391,755/=ක මුදල පැමිණිලි කාරිය වෙත ගෙවීම් කර , පසුව එම මුදල සමාන කොටස් වශයෙන් බෙදා එක් එක් පාර්ෂවයන් වෙතින් අයකර ගැනීම පිළිබඳව සොයා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් , ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා, ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා , ගරු මන්ත්‍රී ටී.ප්‍රෙමතිලක මහතා , විෂයභාර නිලධාරිගේ සහභාගිත්වයෙන් යුතු කමිටුවක් පත්කර, සභාවේ නිතීමය කටයුතු වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාගෙන් උපදෙස් ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීවරුන් සියළුම දෙනාගේ යෝජනාව වු අතර, එම යෝජනාව ගරු සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී. .

ii. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් 2022 ඔක්තෝම්බර් මස සිට මාර්ග ගත ක්‍රමය ඔස්සේ පවත්වනු ලබන ප්‍රසම්පාදනය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාව -2022 සඳහා( මාස තුනක් ) එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය (ලේකම්),වෙත රු:-25000.00ක් වන පාඨමාලා ගාස්තු සහා අරමුදලින් ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා විසින් ස්ථිර කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රනවක කළුආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදි.

iii. 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන කර්මාන්ත සඳහා 2023 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් පරිදි බදු නියම කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අචිල රෝෂන් ලක්මාල් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

## රත්නපුර ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියෙහි (1)වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන කර්මාන්ත සඳහා 2023 වර්ෂයට අදාලව කර්මාන්ත බදු නියම කිරිම සඳහා යෝජනා කරමි.

....................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව.

**කර්මාන්ත බද්ද**

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 150(1)වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව,

(අ) රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේදී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්,

(ආ) 2022 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධ වූවිට යතෝක්ත බද්ද 2021 අප්‍රේල් මස පලමු දිනයට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ගෙවිය යුතු බවටත්,

(ඇ) 2023 වර්ෂයේදී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූවිට යතෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් ඇතුලත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමට රත්නපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

ඉහත කී උපලේඛනය

| 1වන තීරය | 11වන තීරය | | |
|---|---|---|---|
| කර්මාන්තය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | රු.750 දක්වා | රු.750ට වැඩි රු.1500ට නොවැඩි | රු.1500ට වැඩි |
| | රු.ශ | රු.ශ. | රු.ශ. |
| 01.ඇලුමිනියම් භාණ්ඩ,විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 02.ඇඳුම් මැසීමේ,තිරරෙදි මැසීමේ,රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 03.වානේ භාණ්ඩ,ගෘහ භාණ්ඩ,ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 04.වාහන අමතර කොටස්,ටයර් අලෙවි කිරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |
| 05.රබර්, තේ,පොල් ඇතුළු කෘෂි බෝග හෝ සුළු අපනයන ද්‍රව්‍ය මිලදී ගැනිම හා අලෙවි කිරීමේ ස්ථානයක්. | 500.00 | 750.00 | 1000.00 |
| 06.ප්ලාස්ටික් භාණ්ඩ,පිගන් භාණ්ඩ,විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |
| 07.වේවැල් භාණ්ඩ,පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |
| 08.ඡායා පිටපත් කිරීම,බයින්ඩින් කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 09.ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 10.ඡායාරූපාගාරයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11.පින්තූර රාමුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා. | 500.00 | 750.00 | 1000.00 |
| 12.ලොතරැයි අලෙවි කිරීමේ සංචාරක රථ,කුඩු සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 13.කැසට් පට,සංයුක්ත තැටි විකිණීමේ හෝ පටිගත කිරීමේ ස්ථානයක් සඳහා. | 500.00 | 750.00 | 1000.00 |
| 14.වාහන සීට් මැසීම හෝ කුෂන් කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 15.පොත්පත්,ලිපිද්‍රව්‍ය අලෙවිකිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 16.පැණි,කිතුල් හකුරු,කිතුල් පිටි විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17.විසිතුරු මසුන් අලෙවිකිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 18.ඉලෙක්ට්‍රොනික් තරාදි අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 19.සුරතල් සතුන් අලෙවිකරන ස්ථානයක් සඳහා. | 500.00 | 750.00 | 1000.00 |
| 20.පැළ තවාන් ස්ථාන සඳහා(මල්,එළවළු,පළතුරු,තේ,රබර්) | 500.00 | 750.00 | 1000.00 |
| 21.කොමියුනිකේෂන් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22.වැලි,සිමෙන්ති,කළුගල් අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 23.මැණික්,ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 24.ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ හා ගබඩා කර තබාගැනීමේ ස්ථානයක් සඳහා. | 500.00 | 750.00 | 1000.00 |
| 25.ඉංග්‍රීසි, සිංහල බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 26.පොල්තෙල් හැර වෙනත් තෙල් වර්ග අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 27.කෘතිම දත් බැදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28.ජ්‍යොතිෂය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29.තැඹිලි,කුරුම්බා,බුලත්විට විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 30.චිත්‍ර,මූර්ති කැටයම් නිර්මාණය කිරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |
| 31.නිෂ්පාදිත රසකැවිලි,කුළුබඩු,බයිට් වර්ග වැනි පැකට් බඩු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 32.ජංගම දුරකථන අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 33.අමු රබර් එකතු කිරීමේ,තේ දළු එකතු කිරීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 34.පොල්තෙල් හා පොල් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

## රත්නපුර ප්‍රාදේශීය සභාව

### 2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබදව බද්දක් පැනවීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට වාහන හා සතුන් පිළිබදව වාර්ෂික බද්දක් නියම කිරිම සඳහා යෝජනා කරමි .

...................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

**යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ 1වන තිරුවේ නිරුපිත සෑම වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11වන තීරුවේ දැක්වෙන ආකාරයට වාහන හා සත්ව බද්දක් පනවා අයකළ යුතුයැයි රත්නපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

**උපලේඛනය**

| 1වන තීරුව | 11වන තීරුව |
|---|---|
| මෝටර් රථයක්,මෝටර් ට්‍රයිසිකලයක්,මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්,කරත්තයක්,රික්ෂෝවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ගාස්තුව. | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා- | |
| (අ)වෙලද කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ)වෙලද නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4. 00 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයකු,පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| සෑම ඇතකු සඳහා | 50.00 |

විෂ්කම්භය අගල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන,විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙලද කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙලද කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

# රත්නපුර ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාලව බලපත්‍ර ගාස්තු අය කිරිම සඳහා යෝජනා කරමි

....................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව.

**යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.12.05 දිනැති 2152/41 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇති මහජන සෞඛ්‍යයට අදාල වාර්ෂික බලපත්‍රයක් ලබාගතයුතු පහත පලමුවන උපලේඛනයේ සිට තුන්වන උපලේඛනයේ සඳහන් කාර්යය අතුරින් කිසිවක් සඳහා හා හතරවන උපලේඛනයේ දැක්වෙන කාර්යය වලට අදාල යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් 2021 වර්ෂයේදි කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත,පහත දැක්වෙන උපලේඛනයේ 1 තීරුවේ සඳහන් යම් විෂයාංකයක වාර්ෂික වටිනාකම මත 11 තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති අනු ප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතුයැයි රත්නපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

(ආ)තවද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝ ලියාපදිංචි වී ඇති ඇති හෝටලයක්,ආපන ශාලාවක්,නවාතැන්පළක් වන විට ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2022 වර්ෂයේ ලැබීම්වලින්1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂය සඳහා නියම වියයුතු බවටත් යෝජනා කරමි.

**උපලේඛනය**

| **1වන තීරය** | **11වන තීරය** |
|---|---|
| වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක | රු.500.00 |
| වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 |
| වාර්ෂික වටිනාකම රු.1500.00 ඉක්මවන අවස්ථාවක | රු.1000.00 |

## පලමුවන උපලේඛනය

**අප්‍රසන්න ව්‍යාපාර**

1.මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම.
2.පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම.
3.සම් පදම් කිරීම.
4.රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනිම.
5.රබර් භාන්ඩ නිෂ්පාදනය.
6.ඔට්ටපාලු ගබඩාකර තබාගැනීම හෝ විකිණීම.
7.පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම.
8.සත්ත්ව ආහාර නිපදවීම.
9.සබන් නිෂ්පාදනය කිරීම.
10.අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩාකර තබාගැනීම.
11.ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිලට ගැනීම හෝ ගබඩා කර තබාගැනීම.
12.ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම.
13.වේවැල් භාන්ඩ නිපදවීම.
14.වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
15.පොල් ලෙලි පෙගවීම(පල් කිරීම).
16.බුරුසු වර්ග නිපදවීම.(දත් බුරුසු හැර)

17.යන්ත්‍රානුසාරයෙන් දැවඉරීම.
18.පින්තාරු තීන්ත,වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම.
19.කෙදි සායම් කිරීම.
20.සම් භාන්ඩ නිපදවීම.
21.රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම.
22.ගෑස් මැන්ටල් නිපදවීම.
23.පොට් නිපදවීම.
24.ඉටිපන්දම් නිපදවීම.
25.කපුරු නිපදවීම.
26.ලියන තීන්ත,අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
27.රෙදි සෝදන නිල් නිපදවීම.
28.ලාකඩ නිපදවීම.
29.සුවද විලවුන් නිපදවීම.
30.පාසැල් රටහුණු නිපදවීම.
31.ටයර් හෝ ටියුබ් නිපදවීම.
32.ටයර් නැවත පිරවීම.
33.ටයර්,ටියුබ් වොල්කනයිස් කිරීම.
34.සිමෙන්ති ගබඩා කිරීම,ඇස්බැස්ටස් ගබඩා කිරීම.
35.සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
36.වැලි කඩදාසි නිපදවීම.
37.ප්ලාස්ටික් භාන්ඩ නිපදවීම හෝ ගබඩාකිරීම.
38.ගඩොල් පිළිස්සීම හා විකිණීම.
39.යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
40.උළු නිපදවීම හා විකිණීම.
41.භාවිතයට ගත් ගෝනි, බැරල් හා භාජන පිරිසිදු කිරීම.
42.යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල්,මල් පෝච්චි,බීරලු නිපදවීම.
43.කුරුදු,කරදමුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබාගැනීම.
44.ගම් වර්ග නිපදවීම හෝ විකිණීම.
45.විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම.
46.බැටරි පිරවීමේ හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
47.පරණ බෝතල් එකතුකරන ස්ථානයක් පවත්වාගෙන යාම.
48.අවමංගල සේවාවක් පවත්වාගෙන යාම.
49.ගෘහ භාන්ඩ නිපදවීම හා ගබඩාකර තබාගැනීම.
50.මැණික් කැපිම හා ඔප දැමීම.
51.වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම.
52.යාන්ත්‍රික බලයෙන් රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
53.පිටි හෝ කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
54.සත්ත්ව ආහාර ගබඩා කර තබාගැනීම හා විකිණීම.
55.ධාන්‍ය වර්ග ගබඩා කර තබාගැනීම.
56.පොලිතීන් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන කිරීම හෝ විකිණීම.
57.සපත්තු නිෂ්පාදනය හා විකිණීම.
58.ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම.

**දෙවන උපලේඛනය**

**අන්තරාදායක ව්‍යාපාර**

1.යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම.
2.කොප්පරා නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම.
3.යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිදීම හෝ ගබඩාකර තබාගැනීම.
4.පුළුන් ගබඩාකර තබාගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම.
5.ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩාකර තබාගැනීම.
6.මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය.
7.කොහු හෝ වෙනත් කෙදි වර්ග නිෂ්පාදනය.
8. කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් භාන්ඩ නිෂ්පාදනය කිරීම.

9.පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
10.ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම.
11.යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
12.දර විකිණීම.
13.උළු හා ගඩොල් ගබඩාකර තබාගැනීම හා විකිණීම.
14.ටයර් හා ටියුබ් විකිණීමට ගබඩාකර තබාගැනීම.
15.දැව ආශ්‍රිත ලැලි නිෂ්පාදනය සහ දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන.
16.කාඩ්බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩාකර තබාගැනීම හා විකිණීම.
17.ගල් හා පතුරු ගල් ආශ්‍රයෙන් කරන කර්මාන්ත.
18.මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත.
19.නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන.
20.රසායන  ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත.
21.රෙදි සේදීමේ ස්ථාන.
22.බීඩි නිෂ්පාදනය හා ගබඩාකර තබාගැනීම.
23.වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
24.වාහනවල බද කොටස අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
25.වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
26.මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
27.පරණ පත්තර හෝ කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
28.පාපැදි,යතුරු පැදි හා මෝටර් වාහන අලුත්වැඩියා කිරීම.
29.විසිරි පින්තාරු කිරීම.
30.ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩාකිරීම.
31.ලෝහ සංස්කාර්ය කර්මාන්ත යන්ත්‍රෝපකරණ,ආයුධ,උපකරණ නිපදවීම.

## තුන්වන උපලේඛනය

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

1.ඩ්‍රයි ක්ලීන් කිරීම හෝ සායම් දැමීම.
2.රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම හෝ බතික් කිරීම.
3.විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම.
4.ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
5.තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම.
6.හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම.
7.ගිනිකෙළි භාන්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම.
8.ෆයිබර් නිෂ්පාදන.
9.බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
10.ලෝහ වර්ග පැස්සීම.
11.යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
12.වාත්තු වැඩපලක් පවත්වාගෙන යාම.
13.බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
14.මෝටර් වාහන බොඩි තැනීම.
15.කෘමිනාශක,දිලීරනාශක,පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම.
16.විෂබීජනාශක නිපදවීම සහ මදුරු දඟර නිපදවීම.
17.දැව ආරක්ෂණ නිපදවීම.
18.ගල් තාර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථාන.
19.වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබාගැනීම.
20.යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
21.පාස්සන ඊයම් නිපදවීම.
22.ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
23.කටු කම්බි නිපදවීම.
24.කම්බි ඇණ නිපදවීම.
25.කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම.
26.බෙලෙක් බඳුන්,වානේ පීප්ප හෝ කාබන් නිපදවීම.
27.ජී.අයි.බාල්දි නිපදවීම.

28.වායු සමන යන්ත්‍ර,ශීතකරණ,අධිශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
29.බරේක් ලයිනර්,ක්ලච් ලයිනර් නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
30.යන්ත්‍රෝපකරණ නිපදවීම.
31.විදුලි භාන්ඩ නිපදවීම.
32.රබර් මිශ්‍රිත කෙදි නිපදවීම.
33.සංචායක බැටරි නිපදවීම.
34.මෝටර් රථ වාහන එක්ලස් කිරීම.
35.රේඩියේටර් නිපදවීම.
36.ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
37.වියළි කෝෂ බැටරි නිපදවීම.
38.විදුලි බුබුළු නිෂ්පාදනය සහ අලුත්වැඩියාව

**හතරවන උපලේඛනය**

1.පශු වෛද්‍ය සායන පවත්වාගෙන යාම
2.තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර වර්ග තබාගැනීම.
3.කරවල,ලුණු,මාළු හෝ ජාඩි කිලෝ ගෑම් 150කට වැඩි ප්‍රමාණයක් තබාගැනීම.
4.පලතුරු,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම.
5.සිරප් හෝ පලතුරු බීම නිපදවීම.
6.විනාකිරි නිපදවීම.
7.බේකරියක් පවත්වාගෙන යාම.
8..බයිට් වර්ග,රසකැවිලි,කුළුබඩු ,අච්චාරු නිෂ්පාදනය සහ අලෙවිය.
9.බිම්මල් නිෂ්පාදනය.
10.යෝගට්,අයිස් නිෂ්පාදනය.
11.කොසු,ඉදල්,පහන්තිර,හඳුන්කූරු,අභ්‍යාස පොත් නිෂ්පාදනය
12.බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම.
13.තේ කුඩු පැකට් කිරීම හා අලෙවිය.
14.යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැඩීම.
15.කම්මලක් පවත්වාගෙන යාම.
16.වෛද්‍ය රසායනාගාර පවත්වාගෙන යාම
17.පුද්ගලික බෙහෙත් ශාලා පවත්වාගෙන යාම
18.සමූපකාර ප්‍රාදේශික හෝ පුද්ගලික පොලක් පවත්වාගෙන යාම.
19.ගෑස් අලෙවිය
20.පච්චකොටන ස්ථානයක් පවත්වාගෙන යාම
21.වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම.
22.සත්ව පාලනය(මස්,කිරි,බිත්තර සඳහා)
23.වී මෝලක් පවත්වාගෙන යාම
24.බීරළු හෝ කැටයම් කැපීමේ ලියවන පට්ටල් පවත්වාගෙන යාම.

# රත්නපුර ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ව්‍යාපාර සඳහා 2023 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු අය කිරීම යෝජනා කරමි

..............................
සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව.2020

**යෝජනාව.**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ 1වන උප වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ මෙහි උපලේඛනයේ පලමුවන කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2022 වර්ෂයේදී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම දෙවන කොටසේ 1වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්තාවක 11 තීරයේ අනුරූප

සටහනේ නිරූපිත අනුප්‍රමාණ වූ බද්දදක් පනවා අයකළ යුතුයැයි රත්නපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

## උපලේඛනය

### පලමුවන කොටස

**ව්‍යාපාරය**

1.කොමිස් ඒජන්තවරු.
2.වෙන්දේසිකරුවන්.
3.බ්‍රොකර්වරුන්.
4.මුදල් ආයෝජකයින්
5.කොන්ත්‍රාත්කරුවන්
6.සැපයුම්කරුවන්
7.රියදුරු පුහුණුකරුවන්
8.උකස් බඩු ගන්නවුන්
9.ලොතරුයි නියෝජිතයින්
10.මෝටර් රථ වාහන වෙලදාම්කරුවන්
11.පෞද්ගලික අධ්‍යාපන පන්තිකරුවන්
12.රැකියා ඒජන්සිකරුවන්,රක්ෂණ නියෝජිතයින්
13.බියර් බාර් පවත්වන්නන්
14.මත්පැන් බලපත්‍ර සමග නවාතැන්හලක් පවත්වාගෙන යාම
15.රේස් බයි රේස් හිමිකරුවන්
16.පුද්ගලික පොළ හිමිකරුවන්
17.වෛද්‍යවරුන්(ආයුර්වේද හා බටහිර)
18.ඉන්ධන පිරවුම්හලක්
19.ඇගළුම් හා වෙනත් කර්මාන්තශාලා
20.කුලීරථ හිමියන්
21.නීතිඥවරු,නොතාරිස්වරු,මිනින්දෝරුවන්,ගෘහනිර්මාණ ශිල්පීන්
22.පුද්ගලික බස්රථ හිමියන්
23.තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
24.රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
25.රටබීම හලක් පවත්වාගෙන යාම
26.විදුලි සංදේශ කුළුණු සඳහා
27.ජලවිදුලි බලාගාර සඳහා
28.පරිගණක ආශ්‍රිත වෙළඳ ව්‍යාපාර
29.උත්සව භාණ්ඩ කුලියට දීම හෝ අලෙවිය
30.මූල්‍ය ආයතන පවත්වාගෙන යාම
31.ප්‍රදර්ශනාගාර
32.ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන
33.සැලසුම් ශිල්පීවරු
34.පුද්ගලික අධ්‍යාපන ආයතන
35.තොග වශයෙන් භාණ්ඩ වෙළඳාමේ කටයුතු වල නිරතවන්නන්
36.දැන්වීම් පුවරු සැකසීමේ හා වෙළඳ ප්‍රචාරණ ආයතන

### දෙවන කොටස

| **1වන තීරය** | **11 වන තීරය** |
|---|---|
| **2020 වර්ෂයේදී ආදායම** | **රු. ශත.** |
| 1.රු.6000.00 නොඉක්මවන අවස්ථාවක | - |
| 2.රු.6000.00 ඉක්මවන එහෙත් රු.12000.00 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3.රු.12000.00 ඉක්මවන එහෙත් රු.18750.00 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| 4.රු.18750.00 ඉක්මවන එහෙත් රු.75000.00 නොඉක්මවන අවස්ථාවක | 300.00 |
| 5.රු.75000.00 ඉක්මවන එහෙත් රු.150000.00 නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| 6.රු.150000.00 ඉක්මවන අවස්ථාවක | 3000.00 |

# රත්නපුර ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂය සඳහා සේවා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයට ගිවිසුම් ගතවන කර්මාන්ත වටිනාකමින් 1% සේවා ගාස්තු අයකිරීමටත් 2023 වර්ෂයේදී සභාවේ තැම්පත් කරන ඇපතැම්පත් සඳහා 1% සේවා ගාස්තු අයකිරීමට යෝජනා කරමි

.................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

# රත්නපුර ප්‍රාදේශීය සභාව

## 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154(1) වන වගන්තිය යටතේ ඉඩම් විකිණීමේ බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1)වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලද මුදලින් 1%ක බද්දක් සභාවට ගෙවිය යුතු අතර බව යෝජනා කරමි

.................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

# රත්නපුර ප්‍රාදේශීය සභාව

## 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තිය යටතේ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අයකිරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1%ක බද්දක් 2021 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1)ආ ඡේදය යටතේ වන සමානුපාතය වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1% වියයුතු බව යෝජනා කරමි

...................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

# රත්නපුර ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙහි 3වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකකට වැඩි ඉඩමක් සඳහා 2023 වර්ෂයට අක්කර බදු අය කිරිම සඳහා යෝජනා කරමි

...............................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙහි 3වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ඉඩමක් සඳහා 2023 වර්ෂයට රුපියල් පනහක් (50.00) සහ හෙක්ටයාර 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක සෑම හෙක්ටයාරයක් සඳහාම රු.10.00බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්

තවද 2023 වර්ෂය සඳහා ගෙවනු ලබන අක්කර බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් 10%ක වට්ටමක්ද එම අක්කර බද්ද වාරිකවලින් ගෙවන අවස්ථාවක නම් ඒ අක්කර බද්ද අයවිය යුතු කාලසීමා කිරීම පලමුවන මාසය ඇතුළත ගෙවුවහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් 5%ක වට්ටමක්ද ලබාදිය යුතුයැයි රත්නපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

# රත්නපුර ප්‍රාදේශීය සභාව

**ගෘහ හා නගර නිර්මාණ ආඥා පනත යටතේ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමේදී සහ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී පෙරසැරි ගාස්තු අයකිරීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමේදී සහ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදි 2023 වර්ෂයට ගාස්තු අය කිරිම සඳහා යෝජනා කරමි

....................................

සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

.

**සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබදීමේදී අයකරනු ලබන පෙරසැරි ගාස්තු**

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | පෙරසැරි ගාස්තුව |
|---|---|
| ඉඩම් අනුකොටස් වලට බෙදීම සඳහා | අවමය කැබලි **2**ක් සඳහා රු.**500.00**ට යටත්ව වැඩිවන එක් බම් කට්ටියක් සඳහා රු.**250.00** බැගින්. |
| මායිම් තාප්පය | දිග වර්ග අඩියකට රු.**10.00** බැගින් |
| සන්නිවේදන කුළුණු | උපරිම රු.**10000.00**කට යටත්ව කුළුනේ පාදමේ වර්ග අඩියකට රු.**1000.00**බැගින් |

**ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී අයකරන ගාස්තු**

| ගෙබිමේ විශාලත්වය | පෙරසැරි ගාස්තුව(රු.) | |
|---|---|---|
| | නේවාසික | වානිජ/නේවාසික නොවන |
| | රු. ශ. | රු. ශ. |
| වර්ග අඩි 750 හෝ ඊට අඩු | 500.00 | 1000.00 |
| වර්ග අඩි 751 හෝ 1000 දක්වා | 1500.00 | 2000.00 |
| වර්ග අඩි 1001 හෝ 1200 දක්වා | 2000.00 | 3000.00 |
| වර්ග අඩි 1201 හෝ 1550 දක්වා | 2500.00 | 4000.00 |
| වර්ග අඩි 1551 ට වැඩි | 5000.00 | 8000.00 |
| මිනින්දෝරු සැලසුම අනුමත කිරීමේ ගාස්තු | | 1000.00 |

# රත්නපුර ප්‍රාදේශීය සභාව

**<u>2023 වර්ෂයට පෝරම ගාස්තු,සේවා ගාස්තු හා ප්‍රචාරක දැන්වීම් සඳහා වාර්ෂික ගාස්තු අයකිරීම.</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභාව මගින් 2023 වර්ෂයට පෝරම ගාස්තු අයකිරීම,2023

වර්ෂයට සේවා ගාස්තු අයකිරීම හා ප්‍රචාරක දැන්වීම් සඳහා වාර්ෂික ගාස්තු අය කිරිම සඳහා යෝජනා කරමි .

............................
සභාපති,
ඩබ්.ඩී.සුදත් දිසානායක
රත්නපුර ප්‍රාදේශිය සභාව

| **<u>2023 වර්ෂයට පෝරම ගාස්තු අයකිරීම</u>** | | **රු.ශත.** |
|---|---|---|
| I. | පුස්තකාල අයදුම්පත් ගාස්තු | 10.00 |
| II. | පරිසර බලපත්‍ර නිකුත්කිරීමේ අයදුම්පත් ගාස්තු | 100.00 |
| III. | අනිකුත් අයදුම්පත් ගාස්තු | 50.00 |
| IV. | පුස්තකාල දඩ ප්‍රමාද වන දිනකට | 2.00-4.00 |
| V. | පුස්තකාල සාමාජික ගාස්තු | 50.00-100.00 |
| VI. | වාර්ෂිකව පුස්තකාල සාමාජිකත්වය අළුත්කිරීමේ ගාස්තු | 15.00-30.00 |

**<u>2023 වර්ෂයට සේවා ගාස්තු අයකිරීම</u>**

| | | |
|---|---|---|
| **I.** | ජලය ලබාගැනීමේදි මාර්ග පරීක්ෂණ ගාස්තු | 300.00 |
| **II.** | මාර්ග පළුදුවීම් සඳහා අනිවාර්ය ගාස්තු | 600.00 |
| **III.** | වරිපනම් බදු නොගෙවීමට අදාල ලිපි සඳහා ගාස්තු | 150.00 |
| **IV.** | පදිංචියට සුදුසු බව සනාථ කිරීමේ ලිපි සඳහා ගාස්තු | 750.00 |
| **V.** | කුලී ත්‍රීරෝද රථ හිමියන් සඳහා වර්ෂයකට ගාස්තුව | 1000.00 |
| **VI.** | වීරීරේබා සහතිකයක් සඳහා | 1250.00 |
| **VII.** | පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු | 3000.00-10000.00 |
| **VIII.** | පරිසර බලපත්‍ර ගාස්තු(වසර තුනකට වරක්) | 4000.00 |
| **IX.** | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ගාස්තු (අනෙකුත් ) | 750.00 |
| | • කොස් | 1000.00 |

**<u>ප්‍රචාරක දැන්වීම් සඳහා වාර්ෂික ගාස්තු අයකිරීම.</u>**

| | | |
|---|---|---|
| **I.** | වෙළඳ ප්‍රචාරක බැනර් වර්ග අඩියකට | 100.00 |
| **II.** | ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩියකට | 200.00 |

iv. පහත සඳහන් මාර්ග ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරුසභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාවගරු මන්ත්‍රී මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

1. එගොඩ මල්වල ප්‍රධාන මාර්ගය - වේවැල්වත්ත මාර්ගයේ කි.මී.8 කණුව අසළ සිට ගෝණකුඹුර දක්වා
2. කැටලියම්පල්ල ප්‍රධාන මාර්ගය - කැටලියම්පල්ල හංදියේ සිට නව නගරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දක්වා
3. කොළඳගල මුල්ලකන්ද මාර්ගය - පැල්වාඩිය කොළඳගල හංදියේ සිට මුල්ලකන්ද හරහා ගෝණකුඹුර දක්වා
4. අංගම්මන ඇල්ලවත්ත මාර්ගය - අංගම්මන හංදියේ සිට කටුගල ගොඩහේන හංදිය දක්වා

v. සෘජු වෙළෙඳපොළ සහ ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණු වැඩ සටහනක් පැවැත්වීම සුදුසු බව ගරු විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

vi. 2022.09.07 දින පවත්වන ලද අතුරු ව්‍යවස්ථා කමිටුව මගින් පරීක්ෂා කොට නිර්දේශ කරන ලද රත්නපුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඉඩම් සැළසුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සැළසුම් පරීක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා මහා සභාවේඅනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

vii. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා හා ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා විසින් 2023 අයවැය කෙටුම්පතේ සංශෝධනය විය යුතු කොටස් පිළිබඳව සභාව දැනුවත් කළ අතර, ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා මෙම කෙටුම්පත සඳහා විරෝධය එල කළේය. ඒ අනුව 2022.10.21 දින පෙ.ව.10.00ට අයවැය කෙටුම්පතෙහි සංශෝධනයන් පිළිබඳව සාකච්ඡා කර ගැනීම සඳහා රැස්වීමක් යොදා ගැනීම සුදුසු බවත් එතෙක් අයවැය කෙටුම්පත අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු උප සභාපති ජී.ජී.පුෂ්ප කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් සහා සම්මත කරන ලදී.

**2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධව ගරු මන්ත්‍රීතුමාලාගේ අදහස් හා යෝජනා**

**i. ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා**

ප්‍රාදේශීය සභාවේ දැක්ම මෙහෙවර පිළිබඳව අවධානය යොමු කරමින්ම 2023 අයවැය කෙටුම්පත කෙරෙහි හැදින්වීමක් කරන බවත්, මූලිකවම 2022 අයවැය හා 2023 කෙටුම්පත හා සැසදීමේදී අයවැයේ සඳහන් කාරනා මේ වන විට ඉටුවී ඇත්ද යන්න ගරු මන්ත්‍රීවරයා විමසා සිටියේය. ගියවර ක්‍රියාකාරී සැළසුම් ටිකක් ලබා දී තිබුණා මම දැක්කේ නැහැ ඉදිරියට මේ ඇක්ෂන් ප්ලෑන් එක ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න කියන එකේදි අඩුපාඩු රැසක් තිබෙන බව එතුමා පැවසුවේය. සමස්තය පිළිබඳ බලද්දී වැටුප් හා අනෙකුත් ප්‍රතිපූර්ණයන් මිලියන 36.9 වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම් කරනවා 41.9ක් හිඟය තියෙනවා මිලියන 5ක් අවුරුද්දට මෙම මිලියන පහ ප්‍රාදේශීය සභාවට අවුරුද්දට දරාගන්න පුළුවන්ද යන්න පළමුවෙනියටම බලාගන්න සිද්ධවෙනවා. එය අවම කර ගැනීම සඳහා කණ්ඩායමක් විදියට කුමක් කළයුතුද යන්න සාකච්ඡා කළයුතු බව එතුමා පැවසුවේය.මේ ප්‍රතිපූර්ණයන් එක්ක සමස්ථ සියළු ආදායම නම්කරලා තියෙනවා මිලියන 148ක් අපි පෙන්නනවා වැටුප් හා අනෙකුත් ආධාර ඇතුළුව පළාත් සභාවෙන් අපේක්ෂා කරන මිලියන 75ත් ඇතුළුව සියළුම ලැබීම් තියෙන්නෙ මිලියන 112යි. මිලියන 36.3ක වැඩි ආදායමක් තියෙනවා. උසාවි දඩ මිලියන 10 හා මුද්දර ගාස්තු මිලියන 16 එකතුව සමඟ මිලියන 26ක ගත්තට පස්සේ මේ සභාවෙ සත්‍ය ආදායම මිලියන 10යි. මෙය ගැටළුවක් බව එතුමා පැවසුවේය.මාසික ආදයම රුපියල් 864485.00 යි. මාසෙකට ලක්ෂ 35ක් වියදම් කරනවා.181 මුල ධන ආධාර මෙය කොහෙන්ද ගන්නෙ, ගියවර කසළ බදු ලක්ෂ 10ක් ඇස්තමේන්තු කරලා තියෙනවා. පසුගිය අවුරුදු දෙකේ බදු එකතු කිරීම කොපමණද?කර්මාන්ත බදු, ව්‍යාපාර බදු ලක්ෂ 8යි මෙපමන ප්‍රමාණයක්ද එකතු කළ හැක්කේ පළමු මාස අට තුළ එකතු කළ ප්‍රමාණය කොතෙක්ද යන්න මහා සභාවට ඉදිරිපත් කරන්න. මේ අවුරුද්දේ වෙළෙඳ බදු ගාස්තු ලක්ෂ 10ක් ඇස්තමේන්තු කරලා තියෙනවා. වසරකට බදු එකතු කළ හැක්කේ මෙපමණක්ද ආදායම් එකතු කිරීම සඳහා නිලධාරීන් තුන්දෙනෙකු සිටිනවා ඔවුන් ලබා ගන්නා වැටුප වසරකට කොපමනද ඔවුන් විසින් වසරකට කොපමණ ආදායම් මුදලක් එකතු කරනවාද යන්න වාර්තා කරන ලෙස ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා. රස්සාවකට අවාම එයා ලේඩි කෙනෙක්ද එයාට කරන්න පුළුවන්ද කියන කතාව අදාල නෑ රැකියාවක් තෝරාගත්තට පසුව එය

හරියාකාරීව රාජකාරී ඉටුකළයුතු වෙනවා. නැත්නම් එවැනි රැකියා තෝර නොගෙන සිටින්න ඕනි බව එතුමා පැවසුවේය. අද වන විට ලේඩිස්ලා ඕන දෙයක් කරනවා පිරිමි කරන දේවල් නමුත් සභාවේ ආදායම් එකතු කිරීම සිදුවන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ කඩවලින් බදු එකතු කිරීම සිදුවී නැහැ. මම හොඳින් දන්න නිසා තමයි කියන්නේ මන්ත්‍රිට කඩේට ගිහින් බදු එකතු කරන්න බැහැ. මේ පිළිබඳව පසු විපරම් කිරීමේ යාන්ත්‍රයනයක් සකස් විය යුතුයි, ආදායම් සභාවට එකතු කළ යුතුයි. ලේකම් තුමියගේ වගකීමක් නම් ලේකම් තුමිය වගකීම දරන්න ඕනි.නිලධාරීන් ලවා ආදායම් එකතු කළයුතු වෙනවා. වසර අවසානයේදී නිලධාරීන්ගෙන් අහන්න ඕනි ඇයි මේවා එකතු කරන්නෙ නැත්තෙ ඇයි කියලා .මෙය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. 262-2 කියනවා වාහන විකුණලා තුන්ලක්ෂ තිස්පන්දහසක් උපයනවා කියලා .මොන වාහනේද විකුණන්නෙ වාහනේ අංකෙත් සමඟ සභාවට ඉදිරිපත් කරන්න කියලා දන්වන බව එතුමා පැවසුවේය. 362-2 ලක්ෂ දෙකක ආදායමක් ලැබෙන බව පෙන්වලා තිබෙනවා වාහන විකිනීමෙන්, මෙහිදී මොන වාහනය විකිනීමෙන්ද මෙම මුදල් උපයන්නේ කියා සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වන බව එතුමා පැවසුවේය. ඉඩම් විකිණීමේ බදු 1%ක දැනගන්න කැමතියි ගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේ මුල් මාස අට තුළ කොච්චර මුදලක් සභාවට ආවද කියලා. කුලියට දීම ,ශබ්ද විකාශන යන්ත්‍ර, කොඩි කනු,ලොරි රථ , බැක්හෝ ලෝඩර් , ලෙලෙන තලනය,කොන්ක්‍රීට් මිශ්‍රණය කුලියට දීම හා වාහන නැවතුම්පොළ කුලී ගාස්තු මේ අවුරුද්දේදී රුපියල් ලක්ෂ 20ක් ඇස්තමේන්තු කරනවා .මම දැනගන්න කැමතියි.

මං රිලහට වියදම් වලට යනවා.මේ ඉන්ධන හා වෙනත් දීමනා මේ යටතේ මන්ත්‍රීවරුන්ගේ දීමනාවත් ඇතුලත් වෙනවා මේ ජනතාව වක්‍ර බදු හැටියට ගෙවන මුදලින් තමයි ගෙවීම් කරන්නේ මේ සඳහා අපි සාධාරණයක් කළ යුතු වෙනවා. අපි මිලියන 85ක් වෙන් කරනවා ගොඩනැගිලි මංමාවත් කාණු පද්ධති කිරීම සහා අරමුදල් මිලියන 10යි, පළාත් සභා අරමුදල් මිලයන 75යි. හැබැයි මේක හොඳ නැද්ද සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් කොච්චරද වෙන්කරන්නේ කියලා බැලුවනම්.පාරවල් හදන්න කොන්ත්‍රාත් එක අත්සන් කරන එක ලේසි වුනාට මේ කටයුතු වෙනුවෙන් මුදල් වෙන් කිරීම තුළ අපගේ මෙහෙවරට කොපමණ ළගා වනවාද යන්න පසු විපරම් කළයුතු බව එතුමා පැවසුවේය. විෂයන් වෙන්ව ප්‍රතිපාදන වෙන් කරන්නේනම් වෙන් වෙන්ව වියදම් කළ හැකි බවත් එය සුදුසු බව එතුමා පැවසුවේය. 603-9 සමාජසේවා පහසුකම් ලෙස රු:-55000.00ක මුදලක් දාලා තිබෙනවා. මේ මුදල කුමක් අරඹයාද දාලා තියෙන්නෙ මීට කලින් මොකටද මේ මුදල් වෙන්කර තිබෙන්නේ කියලා මේ ගරු සභාව දැනුවත් කරන්න තියෙනවානම් හොඳයි .මම ඉල්ලා සිටිනවා මේ සඳහා විවාදයක් ලබාදෙන්න කියලා. පක්ෂයක් හැටියට ජනතා අභිමතයට අනුව කටයුතු කිරීමට තමයි කැමති.

**ii. ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

503-1 හි වීථි ලාම්පු සඳහා ගිය වසරේ ලක්ෂ අටක් වෙන් කර තිබෙනවා. එම මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොමැතිව වැය ශීර්ෂ මාරු කරමින් නැවත මුදල් ලබා ගත්තා නමුත් මේ සඳහා වැය වූ ප්‍රමාණයන් හා ලබාගත් වීථි පහන් ප්‍රමාණයන් කුමන ස්ථාන වලටද යෙදුවේ යන්න වාර්තාවක් කිසි දවසක ලබා දි නැහැ. අයවැය සාරාංශය 2022 එක හා 2023 සාරාංශය තියෙනවා. නමුත් මේ දෙකේ ලොකු වෙනසක් සිදුවී නැහැ. පුනරාවර්තන ආදායම , පුනරාවර්තන වියදම මේ වන විට ගැලපිලා තිබේද යන්න එතුමා විමසුවේය. ගිය අවුරුද්දෙත් මේ ටික සිදුවෙලා නැහැ. මෙම අයවැයට අනුව තමයි වැඩකටයුතු කළ යුත්තේ නමුත් වැඩකටයුතු සිදුවී නොමැති බව එතුමා පැවසුවේය. අයවැය කෙටුම්පතෙහි රොහාන් මන්ත්‍රිතුමා සඳහන් කළ කාරණා ටික සත්‍යක් බව ඔප්පු කිරීමට හැකියාවක් තිබෙනවානම් අපේ කණ්ඩායමේ දොළොස් දෙනෙක් ඉන්නවා අපිට අවශ්‍ය මෙම අයවැය පරාද කරනවාද යන්න නොවෙයි. ඉදිරි වර්ෂය තුළදී අපිට මෙම අයවැය යටතේ ක්‍රියාත්මක වනවාද යන්න පමණක් දැනගැනීමට අවශ්‍ය බව එතුමා පැවසුවේය.

වීථි ලාම්පු වලට මේ තරම් මුදලක් වෙන් කරනවාට අපි කිසිසේතම් කැමැත්තක් නැහැ. එසේ වෙන්කරනවා නම් අපේ කණ්ඩායමේ මට එපා අනෙකුත් 11 දෙනාට වීථි පහන් ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේ ද යන්න දැනගන්නට අවශ්‍ය බවත්, රොහාන් මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණා සම්බන්ධව සති දෙකක් ඇතුලත වාර්තා කරන ලෙසත්, ඒ පිළිබඳව සෑහීමකට පත්වන්නේනම් අයවැය සම්මත කිරීම සඳහා සහය එල කරන බවත්, නැතහොත් තම කණ්ඩායමේ විරෝධය එල කර සිටින බවත් එතුමා පැවසුවේය.

**iii. ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

ප්‍රාදේශිය සභා පනතට අනුව උපතේ සිට මරණය දක්වාම ප්‍රදේශයේ ජීවත් වන ජනතාව සම්බන්ධයෙන් අවශ්‍යවන සෞඛ්‍ය, අධ්‍යාපනය,මංමාවත් ඒ කාරණා ඉටුකළයුතු අයවැයක් ලෙසයි අපි මෙය හඳුනාගන්නේ. මෙහි කරුණු කාරණා කිහිපයක් කියවලා හදුනා ගත්තා 2022 අයවැය ගත්තත් මේ අයවැය ගත්තත් සංඛ්‍යාත්මකව පුරවපු අයවැයක් ලෙසයි අපි දකින්නේ. සාම්ප්‍රදායික ආදායම හා සාම්ප්‍රදායික වියදම හැරුණුකොට නව ආදායම් උත්පාදන මාර්ග සාකච්ඡා කළත් ඒවාට යොමුවීම පිළිබඳව ප්‍රශ්නයක් ඇති බව එතුමා පැවසුවේය. සංචාරක කර්මාන්තය කර්මාන්තය පිළිබඳව සාකච්ඡා කළා. මේ සභා බල ප්‍රදේශය තුළ අමුතුවෙන් සංචාරක කලාප ඇති කරන්න පිරිවැයක් දරන්න වෙහෙසවීමට අවශ්‍ය නැති බවත්, ස්වාභාවිකව පිහිට ඇති පරිසරය තුළින්ම ආදායම් උත්පාදනය කළ හැකි බව එතුමා පැවසුවේය. විශාල ඇලි ප්‍රමාණයක් තිබෙනවා, පූජාභූමි තියෙනවා, ගංගා ආශ්‍රිතව පරිසර තත්වයන් තිබෙනවා. මේවා උපකාරීකරගෙන ආදාම් උත්පාදනයකට යන්න උත්සහයක් කළාද යන්න මේ තුළ දැකීමට නොහැකි වූ බව එතුමා පැවසුවේය. සෞඛ්‍ය සම්බන්ධයෙන් පසුගිය කාලයේදී කොරොනා තත්වයන්ට මුහුණ දෙන්නට සිදුවුනා එයින් ජීවිත අහිමි වුනා .මේ සඳහා ව්‍යාපෘතියන් ලෙස සභාවක් හැටියට කටයුතු

කරන්නට නොහැකි වීම පිළිබඳව කණගාටු වන බව එතුමා පැවසුවේය. බල ප්‍රදේශයේ පෙර පාසල් ගණනාවක් තියෙනවා. පෙර පාසැල් හතරක් පහක් හෝ තෝරාගෙන ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරගෙන අධ්‍යාපනයට යම්කිසි වැඩපිළිවෙළක් කරගන්නට නොහැකි වී තිබෙන බව එතුමා පැවසුවේය. ආපදාවන්ට ලක්වූ අවස්ථාවන් විශාල ප්‍රමාණයක් දක්නට ලැබුණා පසුගිය කාලයේ අපේ ගම් ප්‍රදේශය හතර වතාවක් ගංවතුරට යට වුනා . මේ පිළිබඳව ප්‍රාදේශීය සභාවක් හැටියට මෙහෙයුම් බලකායක් හදලා ජන ජීවිතය ගොඩනැගීම සඳහා ප්‍රතිපාදනයක් වෙන්කිරීමට කටයුතු නොකළ අයවැයක් ලෙසයි අපි දකින්නේ. ප්‍රාදේශීය සභාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් එනම් මාර්ග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා. 2022 අයවැය තුළින් විපක්ෂයේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේ කෙසේද යන්න තම හෘද සාක්ෂිය දන්නා බවද එතුමා පැවසුවේය. විපක්ෂයේ මන්ත්‍රීවරු ලෙස ඉල්ලුම් කරන යෝජනා වලට කවදාවත් මුදල් වෙන් වුනේ නැහැ.ඒවා අතහැරලා දැම්මා. ඒ පිළිබඳව අපි කණගාටුව ප්‍රකාශ කරනවා. සාම්ප්‍රදායිකව ඉලක්කම් වෙනස්කිරීමක් පමණක් කළ මේ අයවැයට අපගේ විරෝධය එල කරන බව එතුමා පැවසුවේය.

**iv. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා**

රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අරමුණු කරගනිමින් මෙවර අයවැය කෙටුම්පත සකස් කර තිබෙනවා. අපි මේ පසුගිය අවුරුදු දෙක ගත්තොත් නොයෙකුත් අර්බුද වලට මුහුණ පෑමට සිදුවුනා එම තත්වයන් නොදැන ඇතැම් මන්ත්‍රීවරුන් කතා කරන බව එතුමා පැවසුවේය. පසුගිය වසරේ හා ඊට කලින් වසරේ කොරොනා අර්බුදයට මුහුණ දෙන්නට වුනා. මේ කාරණා නිසා ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව එතුමා පෙන්වා දුන්නේය. මේ වසරේ මාර්තු මාසයේ සිට විශාල ආර්ථික කඩා වැටීමකට ලක් වුනා එම නිසා වියදම් සීමා පැනවීම් රජයෙන් සිදු කෙරුනා මේ කාරණා හේතුවෙන් මේ වසරේදීත් බලාපොරොත්තු වූ ආකාරයට කටයුතු සිදුකරගන්නට නොහැකි වූ බවත්, ඉදිරි වසරේදීවත් මෙම අයවැය කෙටුම්පත් කර ඇති ආකාරයට වැඩකටයුතු සිදුකරගැනීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරන බව එතුමා පැවසුවේය.

**v. ගරු සභාපතිතුමා**

රොහාන් මන්ත්‍රීතුමා සඳහන් කල කාරණා සම්බන්ධව අයවැය කෙටුම්පත් කිරීමට ප්‍රථම ඔබතුමාත් සහභාගී කරගනිමින් පවත්වන ලද සාකච්ඡාවේ සඳහන් කළ කරුණුම තමයි මේ සඳහා යොදා ගෙන තිබෙන්නේ . මුදල් අමාත්‍යංශයෙන් ආපු චක්‍රලේඛයේ ප්‍රකාරව සංවර්ධන කටයුතු සිදුකිරීමට සීමා පනවාගන්නට සිදුවුනා සාමාන්‍ය රාජකාරී වලට අදාල කටයුතු පමණයි සිදුකරනු ලැබුවේ. ව්‍යාපෘති සංචාරක ව්‍යාපෘති කිසිවක් කරගන්න බැරි වුනේ ඒ නිසයි. සභාවේ මුදල් තිබුණත් මේ චක්‍රලේඛයේ සීමාවන් නිසා කටයුතු බොහෝමයක් සිදුකරන්නට හැකියාවක් නොතිබුණ බව එතුමා පැවසුවේය.
රටක් හැටියට කුඩා ව්‍යාපාර 71% මධ්‍යම පරිමාණ 65%මහා පරිමාණ 45% වැටිලා තිබෙනවා. මේ තත්වය රටේ සියළුම දෙනාට බලපානවා ඔබ තමුන්නාසේලා ඇතුළු සියළුම දෙනාට හා රටේ සියළුම දෙනාට අත්විදින්නට සිදුවී ඇත්තේ මේ කරුණු බව එතුමා පැවසුවේය. කාලයක් තිස්සේ රටේ පාලකයින් විසින් ගත් තීන්දු තීරණ හේතුවෙන් මේ තත්වය උදා වී ඇති බව එතුමා පැවසුවේය.එය රත්නපුර ප්‍රාදේශීය සභාව විසින් ලබාගත් තීන්දු තීරණ නොවන බව එතුමා පැවසුවේය. ලැබෙන ආදායම් හා ලැබෙයි කියන ආදායම් අනුව සංසන්දනය කරලා තමයි මෙම අයවැය කෙටුම්පත සකස් කරලා තියෙන්නේ . මෙම අයවැය පිළිබඳව විවාදයකට නොගිහින් යෝජනා කරනවා ඉදිරිපත් වූ කරුණු පිළිබඳව ලබන සතියේ දිනක සාකච්ඡාවක් යොදාගෙන ඔබතුමාලාගෙන එන සංශෝධන , අඩුපාඩු තියෙනවානම් ඉදිරිපත් කර සංශෝධනය කරමු ඒ සඳහා දිනයක් යොදා ගන්නා ලෙස සියළුම දෙනාගෙන් ඉල්ලා සිටින බව එතුමා පැවසුවේය. 2022.10.14 වන සිකුරාදා උදේ 10.00ට එම රැස්වීම යොදා ගැනීමේ කටයුතු සිදුකරන ලදී.

**vi. ගරු උප සභාපතිතුමා**

අද දින මහා සභාවට නොපැමිණි සියළුම දෙනාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව එතුමා සඳහන් කළේය. අද දින අයවැය කෙටුම්පත සකස් කිරීම සඳහා පැවති සාකච්ඡා කිරීමේදී රොහාන් මන්ත්‍රී තුමා පැමිණියා බොහෝ මන්ත්‍රීවරුන් පැමිණ සිටියේ නැහැ. කසළ එකතු කිරීමේ දි ලැබෙන ආදායම හා එහි ගැටළු පිළිබඳව තමයි වැඩි දුර කතා කළේ .ඒ සම්බන්ධ නිලධාරීන් හා එක්ව කටයුතු සාකච්ඡා කර තිරණ ගැනීමට සුදුස බව එම සාකච්ඡාවේදී තීරණය කරනු ලැබුවා. අත්‍යවශය කාරණා සඳහා පමණක් වියදම් කරන ලෙසට මුදල් අමාත්‍යංශ ලේකම්වරයා විසින් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණා . මේ වන විට එය ඉවත් කර නැවත චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්, එතුමා පැවසුවේය. ඉදිරියේදී සභාවේ අරමුදල් යොදාගෙන සංවර්ධන ව්‍යාපෘති කිරීමට හැකියාවක් ලැබෙනු ඇතැයි එතුමා පැවසුවේය. එසේම ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පත සංශෝධන සහිතව සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරන බව ගරු උප සභාපතිතුමා පැවසුවේය.

**05:01 හදිසි යෝජනා**

i. දිරාපත්ව අබලන් තත්වයට පත්ව ඇති ගිලීමලේ උප කාර්යාලයේ වහලය හා ඉදිරිපස බිත්ති අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ii. පළාත් පාලන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් 2022 නොවැම්බර් මස මුල සිට වසර 01ක කාලයක් දක්වා පවත්වනු ලබන "මානව සම්පත් කළමණාකරනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -2022/2023 " සඳහා සංවර්ධන නිලධාරී එන්.එස් දමයන්ති මහත්මිය හා කළමනාකරණ සේවා නිලධාරී ඩබ්.ඩී.ඒ.පී. සුගතදාස මහත්මිය වෙනුවෙන් පාඨමාලා ගාස්තු එක් අයෙකුට රු:- 50000.00 බැගින් සභා අරමුදලින් ගෙවීම සඳහා සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා පවසා සිටියේ සභාවේ මුදල් තත්වය යහපත් නොවන කාලයක මෙම මුදල් ලබාදීම පිළිබඳව ගැටළු සහගත බවයි. ඒ අනුව මෙම යෝජනාවට මහා සභාවේ අනුමැතිය ලබා නොදෙන ලදි.

**06.කාරක සභාවල වාර්තා**

2022.10.03 වන දින මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**i. ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා**

ඔබ තුමා සභාපතිතුමා වී සිටින කාලයේදී ඉදිරිපත් කරන ලද සියළුම අයවැය වාර්තා සඳහා අපි විරුද්ධවුනේ නැහැ සහයෝගය දැක්වුවා. ඉදිරි කාලයේදී කළ යුතුව තිබූ වැඩ කොටස් කොරෝනා ප්‍රශ්ණය හේතුවෙන් කරගෙන යන්නට හැකියාවක් නොලැබුණු බවත්, වර්ෂාව නිසා පාරවල් නාය ගියා , ජල ගැටළුවක් මගේ කොට්ඨාශය තුළ තිබුණා එම ප්‍රශ්ණ සඳහා අයවැය තුළින් සහනයක් ලබාදෙන ලෙසත්, මෙම අයවැය කෙටුම්පත දමිළ භාෂාවෙන් මුද්‍රණය කරදීමට කටයුතු කරදෙනමෙන් ඉල්ලා සිටියේය.

අද වන විට දෙහෙන කන්ද මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් ආරම්භ වී තිබෙනවා එයට ස්තුතිවන්ත වන බවත්, වතු රෝහලේ සේවය කරන වෛද්‍යවරයා වෙනුවෙන් නිවාසයක් සාදා දීමේ වැඩකටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් යනවා ඒ සඳහා ඔබතුමා දැක්වූ සහයට ස්තුතිවන්ත වන අතර, මෙම රෝහළ ග්‍රාමීය රෝහළක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය මගින් සිදුකරන්නේනම් ඉතා වටින බව එතුමා සඳහන් කළේය.

දෙහෙනකන්ද මාර්ගය සඳහා ලංගම බස් රථයක් මාසයකට පසුව අද දින ධාවනයේ යොදවා තිබුණා .එය ඉතා අත්‍යවශ්‍ය බවත් දෙහෙන කන්ද ජනතාවගේ ප්‍රවාහන ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර ගතයුතු බව එතුමා සඳහන් කළේය.

වතුවල රැකියා සඳහා අදවන විට තත්වය වෙනස් වී ඇති බවත්, වතු රැකියාව සඳහා ලබාදෙන වැටුප ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඇතැම් පිරිස් කොළඹ ප්‍රදේශය සඳහා රැකියාවලට යාම හා විදෙස්ගතවීම හේතුවෙන් ඉදිරියේදී වතු ආශ්‍රිත ශ්‍රමික පිරිස් අඩුවීමක් දක්නට ලැබෙනු ඇති බවත්, එතුමා පැවසුවේය. මේ හේතුවෙන් වතු ආශ්‍රිතව සිදුකරන කටයුතු අඩාල වීමේ හැකියාවක් ඇති වනු ඇතැයිද එතුමා පෙන්වා දුන්නේය. වතු අධිකාරීවරුන් මේ සම්බන්ධව සාකච්ඡා කර කම්කරුවන් වෙනුවෙන් ලබාදෙන පඩිය වැඩි කරදීමට හෝ කටයුතු කර වතු ජනතානගේ ගැටළු විසඳීම සඳහා පියවර ගතයුතු බව එතුමා වැඩිදුරටත් සඳහන් කලේය.

**ii. ගරු මන්ත්‍රී පත්මා නන්දනී මහත්මිය**

පසුගිය භංවතුර අවධියේදී දෙහෙන කන්ද කොට්ඨාශයේ මාර්ග විනාශ වීම් සිදුවුනා මෙම මාර්ග සකස් කර ගැනීමට අවශ්‍ය සාකච්ඡා පැවත්වුනාට අදවන තෙක් මෙම මාර්ග පිළිසකර කිරීම සිදුවී නැති බව එතුමිය පැවසුවාය. දෙහෙන කන්ද ඉහළ කොටස පාර ඉතාමත් අපහසු තත්වයේ තිබෙන මාර්ගයක් බවට පත් වී තිබෙන බවත්, ජේ.සී.බී.නැතත් කමක් නැහැ. ශ්‍රමයෙන් හෝ සිදු කිරීම සඳහා සභාවෙන් මුදලක් වෙන්කරදෙනමෙන් ඉල්ලා සිටින බව එතුමිය සඳහන් කළේය.

දෙහෙන කන්ද බස් සම්බන්ධව ඩිපෝ අධිකාරීතුමා හමු වී සාකච්ඡා කළා. අද වන විට බස් රථයක් ධාවනය වෙනවා නමුත් මෙම බස් රථ ඇතැම් අවස්ථාවල ධාවනය නොවන අවස්ථා තිබෙනවා. ඒ අවස්ථාවලදී මහජනතාව දැඩි දුෂ්කරතාවයන්ට පත්වෙනවා. අපේ මේ ප්‍රදේශ අතිදුෂ්කර ප්‍රදේශ , මාර්ග ගැටළු මෙන්ම ප්‍රවාහන ගැටළුවද තිබුණත් මේ පිළිබඳව විසඳුම් ලබා දීමට කිසිවෙක් නොමැති බව එතුමිය පැවසුවේය.

අයවැය සම්බන්ධව පසුගිය වසර දෙකකදීම අයවැයට ඡන්දය විමසීමේදී අපි විපක්ෂව ධන්වය භාවිතා කළා. අපි ගැන අපහැදිලිතාවයෙන් ඉන්න ඇති ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් නමුත් මෙවර අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමේදීම මෙයට විරුද්ධ වනවාට වඩා එහි කළයුතු සංශෝධනයන් පිළිබඳව හඳුනාගෙන සාකච්ඡා කිරීමයි කළයුතු වන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉල්ලා සිටියේ 2023 වසරේදීවත් මන්ත්‍රීවරුන් ගේ ඉල්ලීම් පිළිබඳව සළකා බලන ලෙසයි. ඇත්තටම කණගාටුයි. අපේ කොට්ඨාශ වලට කිසිදු දෙයක් ලැබුනෙ නැහැ. අවම වශයෙන් වීථි පහනක්වත් නොලැබුණු බව එතුමිය සඳහන් කළේය. අපේ කොට්ඨාශ වලට සුපිරි පහසුකම් නොවෙයි ඉල්ලන්නේ මිනිසුන්ට ගමන්කළ හැකි මාර්ගයක්, බස් රථයක් , වීථි ලාම්පුවක් වැනි අවම පහසුකම් මේවාවත් නොලැබීම ඉතාම කණගාටුවට කරුණක් බවත්, මං ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව අවධානය දැඩි ලෙස යොමු කරමින් කටයුතු කරන ලෙසටයි.

**iii.ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

රත්තුරුගල මාර්ගයේ වැඩකටයුතු පටන් ගත්තා දෙහෙන කන්ද රත්තුරුගල මල්වල සිරිපාගම මාර්ගය පිළිබඳ දැනගන්න කැමතියි දැනගන්න දැනු තියන තත්වය පිළිබඳව අධික්ෂනයක් කර තිබෙනවාද යන්න. රත්තුරුගල මාර්ගය පසුගිය කාලයේ කතා කළ ආකාරයට කාපට් යොදා සකස් කරනවාද යන්න දැනගැනිමට කැමති බවත් එතුමා පැවසුවේය.

ගිලීමලේ කාර්යාලයේ මුරකරු ධම්මික මහතා සම්බන්ධයෙන් වාහනවල තෙල් සොරාගැනීමක් සිදුවීම සම්බන්ධව පැමිණිල්ලකට කට උත්තරයක් ලබා දීම සඳහා පොලිසියට පැමිනිලා තිබෙනවා. ඒ අවස්ථාවේදී අත්අඩංගුවට පත් වී තිබෙනවා. විශේෂයෙන් සභාවේ වැඩ කරන මහත්මයෙක් විදියට ඇත්තටම කණගාටුව ප්‍රකාශ කර සිටිනවා එතුමා උදේ 10.00ට පොලීසියට ගිය ගමන් පසුවදා උදේ 10.00ට තමයි අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා යොමු කරලා තිබුණේ . එතුමා දහම් පාසලේ උගන්වන පුද්ගලයෙක් සොරකම් කිරීම සම්බන්ධව එතුමාට කවරදාවත් ගමේවත් චෝදනාවක් නොමැති පුද්ගලයෙක්. ඒ නිසා මේ පිළිබඳව මා දේශපාලයෙන් තොරව මැදිහත් වීමක් කළා. ඒ අවස්ථාවේදී නඩුකාරතුමා පවසන්නේ මෙතුමා ඇයි ගෙනවේ කියලා. මේ සම්බන්ධව මේ ආකාරයට රැගෙන එන්න බෑ කියලා. සභාවක් ලෙස මේ සම්බන්ධව සභාවේ වැඩ කරන පුද්ගලයෙක් නිසා මීට වඩා සැළකිල්ලක් දැක්වූවානම් හොඳයි කියා මා සිතනවා. මේ කාලය තුළ සොර සතුරු වුවදුර වැඩි වී තිබෙනවා ඒ නිසා මෙවැනි රාජකාරී කටයුතු සිදුකිරීමේදී වැඩි සැළකිල්ලකින් සිටිය යුතු බවද එතුමා වැඩි දුරටත් පැවසුවේය.

**IV.ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා**

கௌரவ உறுப்பினர்களே உங்கள் அனைவருக்கும் இனிய வணக்கத்தை தெரிவித்துகொள்கினறேன். இந்த வேளையிலே எமது இலங்கை திரைதுரையில் புகழ் பெற்ற நடிகர் தர்ஷன் தர்மராஜ் எம்மை விட்டு பிரிந்துள்ளார். அதற்காக சபையின் சார்பாக எனது ஆழ்ந்த அனுதாபத்தை தெரிவித்துக்கொண்டு அவர் ஆத்மா சாந்தியடைய பிரார்திப்பதோடு கௌரவ தலைவர் அவர்களே சென்ற சபையில் எமது பிரதேசத்தில் CTB பஸ் சம்பந்தமாக எனது விண்ணபங்களை முன்வைத்தேன். ஆனபோதும் சென்ற சபையில் கூறியதை போன்று இன்று தான் அந்த பஸ் எமது பிரதேசத்துக்கு வந்தது. ஆனால் நான் வைத்த கோரிக்கைக்கு இந்த சபை ගිය මාසේ සභා රැස්වීමේදී තමයි සීටීබී බස් රථ සම්බන්ධව කතා කළේ. නමුත් අද තමයි අපේ පාරේ සීටී බී බස් රථය ධාවනය වුනේ.බස් රථ නොමැතිවීම හේතුවෙන් මහත් අපහසුතාවයට පත්ව ඇති බවත්, මෙම සභාවේදී ඉදිරිපත් කරන යෝංනා සම්බන්ධව කටයුතු කළාද නැද්ද යන්න දැනගැනීමට හැකියාවක් නොමැති බවද එතුමා පැවසුවේය.සභාවට යෝජනාවක් ලබා දෙන්නේ තනි පුද්ගලයෙකුට ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බවත්, මේ සභාවෙන් ඔබතුමා තීරණයක් ලබාගෙන එහි පිටපතකින් අපව දැනුවත් කරන්නේනම් ජනතාව ඒ පිළිබඳව දැනුවත් කළහැකි බව එතුමා පැවසුවේය. මෙම බස් රථය දිගටම මෙම මාර්ගයේ ධාවනය කිරීම සඳහා කටයුතු කරදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී. මේ ආර්ථික තත්වයෙන් මිදීම සඳහා ජනතාවට බීජ ලබාදෙන ලෙස මේ සභාවෙන් ඉල්ලීමක් කළා නමුත් මුදල් නොමැති නිසා එය ලැබුනේ නැහැ. මෙවර අයවැයෙන් හෝ ඒ සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලෙස එතුමා ඉල්ලීමක් කළේය. සිරගතවී සිටින සිරකරුවන් යොදාගෙන වගා බිම් සඳහා යොදවා කටයුතු කිරීම සඳහා විකල්පයක් යොදා ගතහැකි බවද එතුමා පැවසුවේය. ගලබඩ ගල්ලැල්ල සමගිපුර වසමේ අලුතින් ආරම්භ කරනු ලැබුවා. එම පුස්තකාලය සඳහ දෙමළ භාෂාවෙන් පොත් පත් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය. ගල්ලැල්ල සමගි පුර ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම තුළින් සභාවට යම්කිසි ආදායමක් ලබා ගතහැකි බවත් ඒ සඳහා උනන්දු වන ලෙසත් එතුමා පැවසුවේය. මෙම ආර්ථික අර්බුදය හේතුවෙන් රැකියා අහිමි වු බොහෝ පිරිසක් සිටිනවා . මොවුන් වගා කටයුතු සඳහා එළඹී තිබුණත් එම වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට නොහැකි වී තිබෙනවා. ගොවිතැන ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වැට සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙසත් එතුමා ඉල්ලීමක්

කළේය. 2023 අයවැය දි හෝ සියළුම මන්ත්‍රීවරුන් සඳහා වීථි ලාම්පු ලබාදෙන ලෙසද එතුමා ඉල්ලීමක් කළේය.

**iii. ගරු සභාපතිතුමා**

අද දින මහා සභාවට පැමිණි සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අයවැය කෙටුම්පත සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ අදහස් විධිමත්ව සාකච්ඡා කිරීම සඳහා 2022.10.14 දින  සිකුරාදා දින සියළුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන සිටින බවත්, ඔවුන්ගේ සංශෝධන පිළිගන්නා බවත් පැවසූ ගරු සභාපතිතුමා විසින් අද දින මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**